සියලු ම හිමිකම් ඇවිරිණි ] முழுப் பதிப்புரிமையுடையது ]All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

11 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

බුද්ධ ධර්මය I, II
பௌத்தம் I, II
Buddhism I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

## බුද්ධ ධර්මය I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.

(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. "භවත්නි ඒ භවත් ගෞතමයාණන් අප දක්නට ඒම නොව, අපම එතුමා දැකීමට යාම සුදුසු ය." මේ එක් බ්‍රාහ්මණයෙක් බුදුරජාණන් වහන්සේගේ ගුණ මහිමය ගෙන හැර දැක්වූ අයුරුයි. එම බ්‍රාහ්මණයා නම්,
   (1) අම්බට්ඨ ය. (2) සෝණදණ්ඩ ය. (3) වච්ඡගොත්ත ය. (4) පොට්ඨපාද ය.

2. "යමෙක් ධර්මය දකියි ද හේ මා දකියි." බුදුරජාණන් වහන්සේ මෙය දේශනා කළේ,
   (1) පුණ්ණ හිමියන්ට ය. (2) ආනන්ද හිමියන්ට ය.
   (3) වක්කලි හිමියන්ට ය. (4) කොසොල් රජුට ය.

3. බුදුවීමෙන් අනතුරුව බුදුරජාණන් වහන්සේ සති හතක් බෝ මැඩ අවට විවිධ ස්ථානවල කල් ගත කළහ. ඒ අනුව හත්වැනි සතිය ගත කළේ,
   (1) රුවන් ගෙයි ය. (2) රාජායතන කිරිපලු රුක යට ය.
   (3) ශ්‍රී මහා බෝධිය අසල ය. (4) අජපාල නුගරුක යට ය.

4. දිනකට එක්වරක් පමණක් දානය වැළඳූ බුදුරදුන්, දානයට පෙර කළ කටයුතු,
   (1) පෙර බත් කිස නමින් හැඳින්වේ. (2) පෙර යම් කිස නමින් හැඳින්වේ.
   (3) පසු බත් කිස නමින් හැඳින්වේ. (4) පැසුළුයම් කිස නමින් හැඳින්වේ.

5. බුදුරදුන් විසින් අනත්ත ලක්ඛණ සූත්‍රය දේශනා කරනු ලැබුයේ,
   (1) මුගලන් තෙරුන්ට ය. (2) පස්වග මහණුන්ට ය.
   (3) සැරියුත් තෙරුන්ට ය. (4) භද්දවග්ගිය හිමිවරුන්ට ය.

6. වීණාව වාදනය කරමින් තෙරුවන් ගුණ පවසමින් ගයන ලද ගීතයක් ඇසූ බුදුරදුන් එය පසසන ලදී. එම ගීතය ගයන ලද්දේ,
   (1) සක් දෙවිඳු විසිනි. (2) පඤ්චසිඛ දෙව් පුතු විසිනි.
   (3) ගුත්තිල ගාන්ධර්වයන් විසිනි. (4) මූසිල ගාන්ධර්වයන් විසිනි.

7. "ගෘහපති තුමනි, මෙම ශරීරය පරිහරණය කරන කිසිවකු මොහොතකට හෝ තමාගේ ශරීරය නිරෝගී යැයි කියයි නම් එය හුදෙක් නොදන්නා කමකි." බුදුරදුන් මෙසේ වදාළේ,
   (1) නකුල පිතාට ය. (2) අනාථ පිණ්ඩික සිටුහට ය.
   (3) චිත්ත ගෘහපතිට ය. (4) යසගේ පියාට ය.

8. මිනිස් වර්ගයා අතුරෙන් උපරිම සංඛ්‍යාවකගේ පූජෝපහාර ලද එකම පුරුෂෝත්තමයා බුදුරජාණන් වහන්සේ ය. මේ ලෙසින් බුදුරජාණන් වහන්සේ අගය කළේ,
   (1) මහාචාර්ය සෝන්ඩර්ස් ය. (2) අබ්දුල් අතාහිලා ය.
   (3) එච්. ජී. වෙල්ස් ය. (4) ආචාර්ය සර්වපල්ලි රාධා ක්‍රිෂ්ණන් ය.

[ දෙවැනි පිටුව බලන්න.

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/

**9.** විවිධ විෂම සමාජයක් තුළ වරදෙහි හා දුසිරිත්වල නොගැවී නොගැටී සිටින ජීවිතය බුදු දහමෙහි ඉගැන්වෙන්නේ,
(1) ධාර්මික ජීවිතය නමිනි. (2) පද්මාකාර ජීවිතය නමිනි.
(3) අවිහිංසක ජීවිතය නමිනි. (4) චාම් ජීවිතය නමිනි.

**10.** පෙළ දහමෙහි සඳහන් පරිදි බුදුරජාණන් වහන්සේගේ ඇවෑමෙන් ශාස්තෘවරයා වූයේ,
(1) සැරියුත් හිමියන් ය. (2) මුගලන් හිමියන් ය.
(3) කොණ්ඩඤ්ඤ හිමියන් ය. (4) ධර්මය හා විනය ය.

**11.** ඇසුරට තමන්ට වඩා උසස් හෝ සමාන මිතුරකු නැතිනම් තනිව වාසය කිරීම සුදුසු බව ප්‍රකාශිත ධම්ම පද ගාථාවේ මුල් දෙපදය වන්නේ,
(1) 'අසාරේ සාරමතිනො - සාරේචාසාර දස්සිනො' යන්නයි.
(2) 'අක්කොච්ජිමං අවධිමං - අජිනිමං අහාසි මෙ' යන්නයි.
(3) 'චරං චේ නාධිගච්ඡෙය්‍ය - සෙය්‍යං සදිසමත්තනො' යන්නයි.
(4) 'සුසුඛං වත ජීවාම - වෙරිනෙසු අවේරිනො' යන්නයි.

**12.** "අසවලා මට බැන්නේ ය, මට පහර දුන්නේ ය මා පරාජය කර ජයග්‍රහණය කළේ ය, මා සතු දෙය පැහැර ගත්තේ ය." ආදී ලෙසින් නිතර නිතර සිහි කළහොත් ඔහු තුළ,
(1) ඉවසීම ගොඩනැඟේ. (2) තණ්හාව ගොඩනැඟේ.
(3) තරහව ගොඩනැඟේ. (4) වෛරය ගොඩනැඟේ.

**13.** සමාජයේ අන් අය ප්‍රාණඝාතාදි දස අකුසල ධර්මයන්ගෙන් අපිරිසිදුව සිටිය ද අපි ඒවායින් වැළකී සිටින්නෙමුයි අදිටන් කරගෙන පිරිසිදු සිතින් විසීම,
(1) අපණ්ණක පටිපදාව නම් වේ. (2) සල්ලේඛ පටිපදාව නම් වේ.
(3) අත්තූපනායික ධර්ම පරියාය නම් වේ. (4) හුහුංක පටිපදාව නම් වේ.

**14.** පංචනීවරණ ධර්ම උපමා පහක් ඇසුරෙන් පැහැදිලි කොට ඇත. ඒ අනුව උද්ධච්ච කුක්කුච්ච යන්න,
(1) පාට කළ වතුර වැනි ය. (2) උතුරන වතුර වැනි ය.
(3) පාසි සහිත වතුර වැනි ය. (4) සෙලවෙන වතුර වැනි ය.

**15.** අනුලෝම පටිච්ච සමුප්පාදයට අනුව සත්ත්වයා තුළ තණ්හාව ඇති වන්නේ,
(1) උපාදානයෙනි. (2) ඵස්සයෙනි.
(3) වේදනාවෙනි. (4) සළායතනයෙනි.

**16.** සිතෙහි නොසන්සුන් ගතිය හා කරන ලද නරක නොකරන ලද හොඳ පිළිබඳව ඇති පසුතැවිලි ගතිය නීවරණයකි. එය,
(1) උද්ධච්ච කුක්කුච්ච නම් වේ. (2) කාමච්ඡන්ද නම් වේ.
(3) විචිකිච්ඡා නම් වේ. (4) ථීන මිද්ධ නම් වේ.

**17.** නිවැරදි දිවි පැවැත්ම නම් නිවැරදි ආකාරයෙන් තම ජීවිකාව සපයා ගැනීමයි. පැවිද්දකුට නම් සිව් පසය ලබා ගැනීම සඳහා නැති ගුණ පෙන්වීම වැනි කුහකකම්වලින් වැළකීම,
(1) සම්මා වායාමයි. (2) සම්මා සතියයි.
(3) සම්මා ආජීවයි. (4) සම්මා සංකප්පයි.

**18.** විපාක දෙන කාලය අනුව සංසාරික ජීවිතයේ කවර අවස්ථාවක හෝ විපාක ලැබෙන කර්ම,
(1) දිට්ඨධම්ම වේදනීය කර්ම වේ. (2) උපපජ්ජ වේදනීය කර්ම වේ.
(3) අපරාපරිය වේදනීය කර්ම වේ. (4) අහෝසි කර්ම වේ.

**19.** බුදුදහමට අනුව සත්ත්වයෝ උස්-පහත් වශයෙන් වෙනස්ව උපත ලබනුයේ,
(1) කර්මය නිසා ය. (2) මව්පියන් නිසා ය. (3) සමාජය නිසා ය. (4) ආගම නිසා ය.

**20.** නිවන සඳහා වන ආර්ය අෂ්ටාංගික මාර්ගය අනුගමනය කිරීමෙහි යෙදෙණු යන අර්ථයෙන් මහා සඟරුවන,
(1) සුපටිපන්න නම් වේ. (2) උජුපටිපන්න නම් වේ.
(3) ඤාය පටිපන්න නම් වේ. (4) සාමීචිපටිපන්න නම් වේ.

**21.** පඤ්ච ස්කන්ධය කිසිසේත් ම ස්ථාවර, නොවෙනස්වන ධර්ම නොවන බව උපමා පහකින් දක්වා ඇත. ඒ අනුව විඤ්ඤාණය,
(1) කෙසෙල් කඳක් වැනි ය. (2) මිරිඟුවක් වැනි ය.
(3) ඇස්බැන්දුමක් වැනි ය. (4) දිය බුබුලක් වැනි ය.

[තුන්වැනි පිටුව බලන්න.

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/

22. අග්ගඤ්ඤ සූත්‍රයෙන් හෙළි කළ පරිදි විශ්වයේ පරිනාමය,
(1) හේතුඵල සම්බන්ධය මත සිදු වේ. (2) සර්ව බලධාරී දෙවියන්ගේ කැමැත්ත මත සිදු වේ.
(3) හේතු ප්‍රත්‍යයක් නොමැතිව ඉබේ සිදු වේ. (4) වාතර විශේෂයකින් සිදු වේ.

23. රූප, ශබ්ද ආදී අරමුණු ලබමින් ඇස් කන් ආදී ඉඳුරන් පිනවීමට ඇති ආශාවෙන් ඉවත්වීමේ ප්‍රතිපදාව,
(1) සීල පාරමිතාවයි. (2) නෙක්ඛම්ම පාරමිතාවයි.
(3) ප්‍රඥා පාරමිතාවයි. (4) වීර්ය පාරමිතාවයි.

24. සමථ භාවනාවේ දී අරමුණු මෙනෙහි කිරීමට යොදා ගත හැකි අරමුණු හතළිහට අයත් **නොවන්නේ**,
(1) දස අසුභ ය. (2) සතර ආරුප්ප ය.
(3) දස අනුස්සති ය. (4) සතර සෘද්ධිපාද ය.

25. සිගාලෝවාද සූත්‍රයේ සඳහන් සදිසා නමස්කාරයෙහි ශිෂ්‍යයා විසින් ගුරුවරයාට කළ යුතු යුතුකම් ගණයට අයත් **නොවන** කාරණය,
(1) අසුනින් නැගී සිටීම් ආදියෙන් ගෞරව කිරීමයි. (2) උපස්ථාන කිරීමයි.
(3) මනාව ගුරුවරයාට සවන් දීමයි. (4) දුසිරිතයෙහි නොයෙදීමයි.

26. කරණීය මෙත්ත සූත්‍රයෙහි සඳහන්'සන්තුස්සක' යන්නෙහි අර්ථය,
(1) කටයුතු බහුල නොවීම යන්නයි. (2) ලද දෙයින් සතුටු වීම යන්නයි.
(3) සන්සුන් ඉඳුරන් ඇති වීම යන්නයි. (4) නුවණැති වීම යන්නයි.

27. පස්පව්, දස අකුසල් කරමින් දුශ්ශීලව, ශ්‍රද්ධාවෙන් තොරව මසුරු මලින් අපවිත්‍ර වූ සිතින් යුතුව, පැවිද්දන්ට නිග්‍රහ කරමින් ගිහිගෙයි වසන පුරුෂයා හා ස්ත්‍රිය බුදුරදුන් සමාන කොට ඇත්තේ,
(1) පිරිමි මළ කඳක් ස්ත්‍රී මළ කඳක් හා එකට විසීම ලෙසිනි.
(2) පිරිමි මළ කඳක් දෙව්දුවක හා එකට විසීම ලෙසිනි.
(3) දිව්‍ය පුත්‍රයකු ස්ත්‍රී මළ කඳක් හා එකට විසීම ලෙසිනි.
(4) දිව්‍ය පුත්‍රයකු දෙව් දුවක හා එකට විසීම ලෙසිනි.

28. බුදුරජාණන් වහන්සේ විසින් දැහැමි රාජ්‍ය පාලනය සඳහා බෞද්ධ ප්‍රතිපත්ති රැසක් දේශනා කොට ඇත. පහත සඳහන් කරුණු අතර රාජ්‍ය පාලන ප්‍රතිපත්තියක් **නොවන්නේ**,
(1) දසරාජ ධර්මයි. (2) සතර සංග්‍රහ වස්තූන් ය.
(3) අපරිහානිය ධර්මයි. (4) සතර කර්ම ක්ලේශයන් ය.

29. "දරුව, මෙම චක්‍රවර්ති රාජ්‍යය ඔබට පිය උරුමය ලෙස ලැබෙන්නක් නොවේ. ඔබ ඒ සඳහා නිසි පිළිවෙත් පුරා සුදුස්සෙකු විය යුතු ය." මෙම ප්‍රකාශය අඩංගු සූත්‍රය වන්නේ,
(1) කූටදන්ත සූත්‍රයයි. (2) අග්ගඤ්ඤ සූත්‍රයයි.
(3) චක්කවත්ති සීහනාද සූත්‍රයයි. (4) මහා සීහනාද සූත්‍රයයි.

30. ලොව ඇත්තේ එකම මිනිස් ජාතියකි. ජීව විද්‍යාත්මකව බෙදා දක්වන්නේ නම් ඒ ස්ත්‍රී පුරුෂ යනුවෙනි. එහෙත් එය ලිංග භේදයක් මිස ජාති හෝ කුල භේදයක් නොවන බව බුදුරදුන් දේශනා කළේ,
(1) සර්ව මිත්‍ර බමුණාට ය. (2) වාසෙට්ඨ බමුණාට ය.
(3) පොක්ඛරසාති බමුණාට ය. (4) අදින්න පුබ්බක බමුණාට ය.

31. ප්‍රථම ධර්ම සංගීතියෙන් පසු ධර්ම විනය, මුඛ පරපුරින් රැකගෙන ඉදිරියටත් ගෙන යාම උදෙසා භාණක පරපුරක් බිහි කොට පවරන ලදී. ඒ අනුව බුද්දක නිකාය පැවරුණේ,
(1) ආනන්ද තෙරුන් ප්‍රමුඛ සිසු පරපුරටයි. (2) කාශ්‍යප තෙරුන් ප්‍රමුඛ සිසු පරපුරටයි.
(3) සියලු ම භික්ෂූන් වහන්සේලාටයි. (4) පුරාණ හිමියන් ප්‍රධාන සිසු පිරිසටයි.

32. ථෙරවාදී සිවුවන සංගායනාව ක්‍රිස්තු වර්ෂාරම්භයේ දී පවත්වන ලද්දේ,
(1) පැලලුප් නුවර අශෝකාරාමයේ දී ය. (2) මාතලේ ආලෝක විහාරයේ දී ය.
(3) සැවැත් නුවර ජේතවනාරාමයේ දී ය. (4) කාශ්මීරයේ කුණ්ඩල වනයේ දී ය.

33. ධර්මාශෝක රජුගේ ධර්ම විජය ප්‍රතිපත්තියට අනුව නව රට ධර්ම ප්‍රචාරය සඳහා ස්වර්ණ භූමියට වැඩම කළේ,
(1) මජ්ඣන්තික හිමි ය. (2) සෝණ-උත්තර හිමිවරු ය.
(3) මජ්ඣිම හිමි ය. (4) මහා රක්ඛිත හිමි ය.

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/

11897

**34.** මුල් යුගයේ කලාකරුවන් විසින් කළ කැටයම්හි බුදුරදුන් වෙනුවට භාවිත කළේ සංකේතයන් ය. එසේ භාවිත **නොකළ** සංකේතයක් වන්නේ කුමක් ද?
(1) වජ්‍රාසනය (2) පද්මය (3) බෝධිය (4) රශ්මි මාලාව

**35.** පැරණි සිංහල සාහිත්‍යය හැදෑරීමේ දී රටෙහි පාලන යුග අනුව සාහිත්‍ය යුගද බෙදා ඇත. ඒ අනුව පිළිවෙළින් යුග බෙදා වෙන් කිරීමේ දී තුන්වැනි යුගය වන්නේ,
(1) අනුරපුර යුගයයි. (2) දඹදෙණි යුගයයි.
(3) කුරුණෑගල යුගයයි. (4) ගම්පොල යුගයයි.

**36.** අනුරපුර යුගයෙන් අපට ඉතිරිව ඇති එකම පද්‍ය කෘතිය වන්නේ,
(1) සියබස්ලකරයි. (2) කව්සිළුමිණයි.
(3) මුවදෙව්දාවතයි. (4) ගුත්තිල කාව්‍යයයි.

**37.** "සිංහල බෞද්ධ දරුවනි, දිවි යතත් බොරුවක්, මුසාවක් නොකියන්නට අධිෂ්ඨාන කර ගනිත්" මෙම ප්‍රකාශය කළේ,
(1) හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා ය. (2) බ්ලැවට්ස්කි මැතිණියයි.
(3) මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි ය. (4) ශ්‍රීමත් අනගාරික ධර්මපාල තුමා ය.

**38.** "සවෙ මානුසා මම පජා" මෙම ප්‍රකාශයට අදාළ පාලකයා වන්නේ,
(1) ධර්මාශෝක රජු ය. (2) කොසොල් මහ රජු ය.
(3) බිම්බිසාර මහ රජු ය. (4) අජාසත් මහ රජු ය.

**39.** ධාර්මිකව ධනය උපයන මෙන් බුදුදහමෙන් බෞද්ධයන්ට උපදෙස් දී ඇත. ඒ අනුව ධාර්මික ධනය උපයාගත හැකි මාර්ගයක් **නොවන්නේ,**
(1) ගව පාලනයයි. (2) වෙළඳාමයි.
(3) රාජ්‍ය සේවයයි. (4) වහල් සේවයයි.

**40.** දන්ත ධාතුන් වහන්සේ සිරිලකට වැඩම වන ලද්දේ,
(1) දුටුගැමුණු රජ දවස ය. (2) වළගම්බා රජ දවස ය.
(3) උපතිස්ස රජ දවස ය. (4) කිත්සිරිමෙවන් රජ දවස ය.

* *

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/

සියලු ම හිමිකම් ඇවිරිණි ] முழுப் பதிப்புரிமையுடையது ]All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

11 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

බුද්ධ ධර්මය I, II
பௌத்தம் I, II
Buddhism I, II

## බුද්ධ ධර්මය II

* **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* පළමුවැනි ප්‍රශ්නයට ලකුණු **20** ක් ද තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ද හිමි වේ.

**1.** (i) මහාභිනිෂ්ක්‍රමණය කළ සිදුහත් තාපසතුමා මුලින් ම සත්‍ය සොයා ගිය ආචාර්යවරුන් **දෙදෙනාගේ** නම් ලියන්න.

(ii) බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පා වදාළ ස්ථානය කුමක් ද?

(iii) බුදුදහමේ දැක්වෙන කුසල මූල තුනකි. ඉන් **දෙකක්** ලියා දක්වන්න.

(iv) සතර සංග්‍රහ වස්තු ලියන්න.

(v) "සබ්බ පාපස්ස අකරණං - කුසලස්ස උපසම්පදා" මෙම පාඨයේ අදහස ලියන්න.

(vi) 'අත්ථි සුඛය' යන්නෙහි අර්ථය පැහැදිලි කරන්න.

(vii) බිම්බිසාර රජු හා අනාථපිණ්ඩික සිටු යන දෙදෙනා විසින් ඉදිකර පූජා කරනු ලැබූ ආරාම **දෙක** මොනවා ද?

(viii) "න ජච්චා වසලෝ හොති - න ජච්චා හොති බ්‍රාහ්මණෝ" මෙම පාඨයෙන් අවධාරණය කරන්නේ කුමක් පිළිබඳව ද?

(ix) අමාවතුර හා සද්ධර්මරත්නාවලිය යන ග්‍රන්ථ රචනා කළ කතුවරුන්ගේ නම් ලියන්න.

(x) 'සඳකඩ පහණ' යන්න සැකෙවින් පැහැදිලි කරන්න.

**2.** (i) කරණීය මෙත්ත සූත්‍රයේ දැක්වෙන පරිදි මෙත් වඩන්නකු තුළ තිබිය යුතු චරිත ලක්ෂණ (ගුණාංග) අතුරෙන් **දෙකක්** නම් කරන්න.

(ii) එම සූත්‍රයේ දැක්වෙන පරිදි මෛත්‍රිය වැඩිය යුතු ආකාරය පහදා දෙන්න.

(iii) මෙත් වැඩීම පෞද්ගලික මානසික සහනය සඳහා මෙන්ම සමාජ සුහදත්වය සඳහා ද ඉවහල් වන ආකාරය පහදන්න.

**3.** (i) 'වෛරය කිසි කලෙකත් වෛරයෙන් නොසංසිඳෙන බව' දැක්වෙන ධම්ම පද ගාථාව ලියන්න.

(ii) එම ගාථාවේ අදහස ලියන්න.

(iii) මෙම ගාථාවේ ඉගැන්වෙන උපදෙස් සමාජ ගැටුම් නිරාකරණය කර ගැනීමට ඉවහල් වන ආකාරය පැහැදිලි කරන්න.

**4.** (i) සිගාලෝවාද සූත්‍රයේ ඉගැන්වෙන යුතුකම් ඉටු කළ යුතු උඩ හා යට දිසාවන්ට උපමා කළෝ කවරහු ද?

(ii) ඔබ දැක්වූ එක් සමාජ කණ්ඩායමක් විසින් ඉටු කළ යුතු යුතුකම් **තුනක්** ලියන්න.

(iii) යහපත් සමාජ සම්බන්ධතා ගොඩනංවා ගැනීම සඳහා මෙම සූත්‍රාගත කරුණු ඉවහල් වන ආකාරය පහදන්න.

**5.** (i) බුදුදහමට අනුව පරිසරය යන්න අර්ථ දක්වන්න.

(ii) පරිසරය සුරැකීමේ ඇති වැදගත්කම බුදුරජාණන් වහන්සේගේ ද ඇගයීමට ලක්වී ඇති අයුරු විස්තර කරන්න.

(iii) පරිසර දූෂණය වැළැක්වීම හා පරිසර සංරක්ෂණය සමාජ යුතුකමක් වන අයුරු පැහැදිලි කරන්න.

[හයවැනි පිටුව බලන්න.

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/

6. (i) පළමු ධර්ම සංගායනාව පැවැත්වීමට හේතු වූ කරුණු ගෙනහැර දක්වන්න.

(ii) පළමුවන ධර්ම සංගායනාව පැවැත්වූ ස්ථානය, අනුග්‍රහය දැක්වූ පාලකයා හා මූලිකත්වය ගෙන ක්‍රියා කළ රහතන් වහන්සේ ලියා දක්වන්න.

(iii) ධර්ම විනය දෙකෙහි අනාගත සුරක්ෂිතතාව ඇති කරලීමට පළමු ධර්ම සංගායනාව ඉවහල් වූ අයුරු පැහැදිලි කරන්න.

7. (i) ගර්භයේ හැඩය අනුව ස්තූප වර්ග හයකට බෙදා දැක්වේ. ඉන් වර්ග දෙකක් දක්වන්න.

(ii) වටදාගෙය හා වාහල්කඩ සැකෙවින් හඳුන්වන්න.

(iii) ශ්‍රී ලාංකික ශිල්පීන්ගේ කලා කුසලතාව ස්තූප නිර්මාණය ඇසුරෙන් ඇගයීමට ලක් කරන්න.

* * *

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/